# ළමා භාෂාව හා අර්ථ උපාර්ජනය

ආර්.එම්.ඩබ්ලිව්. රාජපක්ෂ, වාග්විද්‍යා අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

සිංහල දරුවන් දෙදෙනකුගේ භාෂාර්ථ උපාර්ජනය පිළිබඳ වාග්විද්‍යාත්මක විග්‍රහයක් ඉදිරිපත් කිරීම මෙහි අරමුණයි.

භාෂා උපාර්ජනය (Language Acquisition) මනෝ විෂයක වාග්විද්‍යාවෙහි (Psycholinguistic) සාකච්ඡා කෙරෙන ප්‍රධාන මාතෘකාවකි. කුඩා දරුවකු වයසින් වැඩෙද්දී ඔහුගේ මව් භාෂාව (බහු භාෂක දෙමාපියන්ගේ දරුවකු නම් භාෂා දෙක හෝ කිහිපය) වර්ධනය වන්නේ කෙසේද යන්න එහිදී හැදෑරේ. භාෂා වර්ධනය විධිමත් රටාමය වූවකි. එය හුදු අනුකරණයක් නොවේ. භාෂාවේ ශබ්ද ප්‍රස්තරය, ව්‍යාකරණය හා වාක්කෝෂය යන සෑම අංගයකම මෙම විධිමත් භාෂා වර්ධනය දක්නට ලැබේ.

භාෂා අර්ථය රූපීය ව්‍යාකරණය (Formal Grammar) හා පසු කාලීන වාග්විද්‍යාත්මක සිද්ධාන්ත මත නිර්වචනය කෙරේ. ශබ්ද හා ව්‍යාකරණය සමග සසඳන විට අර්ථය අතිශයින් සංකීර්ණ වේ. ශබ්ද හා ව්‍යාකරණය ප්‍රත්‍යක්ෂ සාධක වශයෙන් ගත හැකි වුවද අර්ථය එසේ ප්‍රත්‍යක්ෂ සාධකයක් ලෙස ගැනීම අපහසු බැවිනි. කෙසේ වුවද ළමා සන්නිවේදනයට හා චර්යාවන්ට අනුව ඔහුගේ බසෙහි සිදුවන අර්ථ උපාර්ජනය අධ්‍යයනය කළ හැකිය. භාෂා උපාර්ජනය හැදෑරීමේ දී දක්නට ලැබෙන කරුණු තුනකි. ලොව සෑම බසකටම පොදු එකම විශ්වව්‍යාපී ලක්ෂණ, ඒ ඒ, භාෂාවලට සීමා වූ ලක්ෂණ හා දරුවාගේ පෞද්ගලික ලක්ෂණ වශයෙනි. මෙම අධ්‍යයනයෙන් එබඳු ලක්ෂණ විග්‍රහ කොට ඉදිරිපත් කෙරේ.